**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජනවාරි 2017

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

---

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය අනු ප්‍රශ්න 15 කින් සමන්විතය. අනු කොටස්වලට දී තිබූ පිළිතුරු අනුව පොදුවේ දක්නට ලැබුනු දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

(1) දී ඇති උපදෙස් සැලකිල්ලට නොගත් සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්න සඳහා උත්තර, සපයන ලද උත්තර පොතේ නොලියා ප්‍රශ්න පත්‍රය තුලම සටහන් කර උත්තර පත්‍රයට අමුණා තිබෙනු දක්නට ලැබුණි.

(2) තවත් සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්න සඳහා අදාල අංකය වෙනුවට සම්පූර්ණ උත්තර, උත්තර පොතේ ලියා කාලය අපතේ යවා තිබෙනු දක්නට ලැබුණි.

(3) **ප්‍රශ්න අංක 1.4**

පොදු ජර්නලයේ සටහන් කරනු නොලබන අයිතම මොනවාද යන්න පැහැදිලිව හඳුනා නොගත් සමහර අයදුම්කරුවන් වැරදි උත්තර සපයා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි උත්තරය වන්නේ අංක (3) ආරම්භක ශේෂ සටහන් කිරීම වුවද බොහෝ පිරිසක් අංක (4) භාණ්ඩ ණයට විකිණීම ලෙස දක්වා තිබුණි.

(4) **ප්‍රශ්න අංක 1.5**

මුළු වත්කම් නිවැරදිව ගණනය කර තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකි. ආරම්භක ප්‍රාග්ධනය, වර්ෂයේ ගැනිලි, ලාභය සහ වර්ෂය අවසානයේ වගකීම් පදනම් කරගෙන මුළු වත්කම් ගණනය කරන ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැතිකමින් බොහෝ පිරිසක් වැරදි උත්තර සපයා තිබුණි.

(5) **ප්‍රශ්න අංක 1.7**

සුළු මුදල් ප්‍රතිපූර්ණය පිළිබඳව සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසකට නිවැරදි අවබෝධයක් නොමැති බව දක්නට ලැබුණි. ප්‍රතිපූර්ණය කළ යුතු වන්නේ වියදම් කළ මුදලට සමාන වූ රු.1,275/- ක් වුවද බොහෝ පිරිසක් අග්‍රිමය වූ රු.5,000/- න් වියදම් කළ රු.1,275/- අඩුකළ පසු එන අගය වූ රු3,725/- ප්‍රතිපූර්ණය කළ යුතු අගය ලෙස දක්වා තිබුණි.

(6) **ප්‍රශ්න අංක 1.8**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් වැඩි පිරිසක් වැරදි උත්තර සපයා තිබුණි. ලාභ සමීකරණය භාවිත කර ආයතනයේ ශුද්ධ ලාභය / අලාභය ගණනය කිරීම පිළිබඳව බොහෝ පිරිසකගේ දැනුම අඩු මට්ටමක පවතින බව දක්නට ලැබුණි. නිවැරදි උත්තරය අංක (4) රු.28,000/- ශුද්ධ ලාභය වුව ද බොහෝ පිරිසක් අංක (3) රු.52,000/- උත්තරය ලෙස දක්වා තිබුණි.

(7) **ප්‍රශ්න අංක 1.9**

මෙම ප්‍රශ්නයටද අයදුම්කරුවන් වැඩි පිරිසක් වැරදි උත්තර සපයා තිබුණි. පරිගණකගත ගිණුම්කරණ පද්ධතියකදී භාවිත කරනු ලබන ප්‍රධාන ගොනු (master files) පිළිබඳ බොහෝ පිරිසකගේ දැනුම ඉතා අඩු මට්ටමක පවතින බව දක්නට ලැබුණි. බොහෝ පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා ගිණුම්කරණ පැකේජ වල නම් ලියා තිබෙනු දක්නට ලැබුණි.

(8) **ප්‍රශ්න අංක 1.11**

බොහෝ පිරිසක් ප්‍රාග්ධන වියදම් සහ අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණ ද එය පැහැදිලි කිරීමට අපොහොසත් වී ඇති බව දක්නට ලැබුණි.

(9) **ප්‍රශ්න අංක 1.14**

අදාල මූලාශ්‍ර ලියවිලි (source documents) පිළිබඳ දැනුම නොමැතිකමින් සමහරු ගනුදෙනුවලට අදාල මූලික පොත්වල නම් සඳහන් කර තිබුණි.

(10) **ප්‍රශ්න අංක 1.15**

අදාල ද්විත්ව සටහන සඳහන් කරන ලෙසට ප්‍රශ්න පත්‍රයේ පැහැදිලිවම සඳහන් කර තිබුණ ද එය සැලකිල්ලට නොගත් සමහරු ගනුදෙනුවලට අදාල ලෙජර් සටහන් තබා තිබෙනු දක්නට ලැබුණි. තවද, සම්පූර්ණ ණය මුදල පියවා දැමීම සඳහා ණයහිමියන්ට රු.30,000/- ගෙවීමේදී ලැබුණු වට්ටම වූ රු.2,000/- පිළිබඳව බොහෝ පිරිසක් ද්විත්ව සටහන දක්වා නොතිබුණි.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය (a) සහ (b) වශයෙන් කොටස් දෙකකින් සමන්විත විය. (a) කොටසින් ගිණුම්කරණ සමීකරණය පිළිබඳ දැනුම ද, (b) කොටසින් ගිණුම්කරණ සංකල්ප පිළිබඳ දැනුම ද, පරීක්ෂාවට ලක්කර ඇත.

උත්තර ඇගයීමේදී පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කිපයක් පහත දැක්වේ:

(1) අදාල කරගත යුතු ගිණුම්කරණ සමීකරණය ප්‍රශ්න පත්‍රයෙහිම සඳහන් කර තිබුණ ද, එය සැලකිල්ලට නොගත් සමහරු තමන් ගොඩනගාගත් සමීකරණයක් තුළ අදාල ගනුදෙනුවල බලපෑම සටහන් කිරීමට උත්සහාගෙන තිබෙනු දක්නට ලැබුණි. තවත් සමහරු අදාල ගනුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සමීකරණය තුළ නොදක්වා වාක්‍ය ස්වරූපයෙන් ලිවීමට උත්සහාගෙන තිබුණි.

(2) ජුනි මාසය සඳහා කාර්ය මණ්ඩලයට ගෙවූ වැටුප වූ රු.45,000/-, මුදල් තීරයේ -45,000 සහ ප්‍රාග්ධන තීරයේ -45,000 ලෙසට සඳහන් කළ යුතු වුවද ඇතැම් අයදුම්කරුවන් එය ප්‍රාග්ධන තීරයේ සටහන් නොකර වගකීම් තීරයේ -45,000 ලෙසට සටහන් කර තිබුණි.

(3) ණය පදනම මත රු.10,000/- කට කාර්යාල උපකරණ මිලදී ගැනීම ස්ථාවර වත්කම් සහ වගකීම් තීරවල සඳහන් කළ යුතු වුවද සමහරු අත්පිට මුදලට මිලදී ගැනීමක් ලෙස සලකා එය මුදල් තීරයේ සහ ස්ථාවර වත්කම් තීරයේ සටහන්කර තිබුණි.

(4) පිරිවැය, රු.40,000/- ක් වූ භාණ්ඩ ණය පදනම මත රු.60,000/- කට විකිණීම තුලින් ජනිත වන රු.20,000/- ක් වූ ලාභය ප්‍රාග්ධන තීරයට + 20,000 ලෙසට සටහන් කළ යුතු වුවද බොහෝ පිරිසක් එය අත්හැර තිබුණි.

(5) යෙදවූ අතිරේක ප්‍රාග්ධනය රු.90,000/- මුදල් තීරයේ සහ ප්‍රාග්ධන තීරයේ සටහන් කළ යුතු වුවද, සමහරු එය මුදල් තීරයේ නිවැරදිව සඳහන් කළ නමුත් වැරදි ලෙස වගකීම් තීරයේ සටහන් කර තිබෙනු දක්නට ලැබුණි.

(6) ගිණුම්කරණ සමීකරණය පිළිබඳව 90% කට වැඩි පිරිසකගේ දැනුම ඉතාමත් අඩු මට්ටමක පවතින බව දි ඇති උත්තර වලින් පෙනුණි.

(7) අස්තිත්ව සංකල්පය පිළිබඳව (Entity Concept) බොහෝ පිරිසක් උත්තර සපයා නොතිබූ අතර උත්තර සැපයුවන්ගෙන් වැඩි පිරිසක් අවබෝධයකින් තොරව වැරදි ලෙස උත්තර ලියා තිබුණි.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ශේෂ පිරික්සුම පිළියෙල කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත.

ඉහත කොටස් දෙකටම අදාලව අයදුම්කරුවන්ගේ පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කිපයක් පහත දැක්වේ:

(1) සමහරු ශේෂ පිරික්සුමේ හර සහ බැර පැති මාරුකර, හරට සටහන් කළ යුතු ඒවා බැර පැත්තේත්, බැරට සටහන් කළ යුතු ඒවා හර පැත්තේත් සටහන් කර තිබුණි.

(2) අදාල ප්‍රශ්නයට අනුව, ණයගැති සහ ණයහිමි ලෙජර් ගිණුම් තුලින් විකුණුම් සහ ගැනුම් වට්ටම් සොයා ශේෂ පිරික්සුමට ඇතුලත් කළ යුතු වුවද, එවැනි අවබෝධයක් නොමැති සමහරුන් විකුණුම් සහ ගැනුම් නොමැතිව ශේෂ පිරික්සුම පිළියෙල කර තිබෙනු දක්නට ලැබුණි.

(3) කාර්යාල උපකරණ මිලදී ගෙන ඇත්තේ ගිණුම් වර්ෂයේ අවසාන දිනයේදී වන හෙයින් එම වර්ෂයට ක්ෂය කිරීමක් අවශ්‍ය නොවේ. එහෙත් එය අවබෝධ කර නොගත් සමහරු 10% බැගින් මුළු වර්ෂයටම ක්ෂය ගණනය කර සටහන් කර තිබුණි.

(4) ශේෂ පිරික්සුම පිළියෙල කිරීම පිළිබඳව නිවැරදිව අවබෝධ කර නොගත් සමහරු ඒ වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කර තිබුණි.

(5) උපචිත විදුලි ගාස්තු සැලකිල්ලට නොගත් සමහරු ගෙවූ විදුලි ගාස්තු රු.45,000/- ක් පමණක් ශේෂ පිරික්සුමේ සටහන් කර තිබෙනු දක්නට ලැබුණි.

(6) බැංකු ණය පොලිය නිවැරදිව ගණනය කර තිබුණේ ඉතාමත් සුළු පිරිසකි.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නයද (a) සහ (b) වශයෙන් කොටස් දෙකකකින් සමන්විත විය. (a) කොටසින් වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් පිළියෙල කිරීම පිළිබඳව ද, (b) කොටසින් අවිනිශ්චිත ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ ද දැනුම පරීක්ෂාවට ලක්කර තිබුණි. දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුනු දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

(1) දී ඇති උපදෙස් හරිහැටි අවබෝධ කර නොගත් සමහරු ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙල කර තිබෙනු දක්නට ලැබුණි.

(2) මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබූ ව්‍යාපාරයේ හිමිකරු විසින් ඔහුගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා ගත් රු.175,000/- ක් වූ මුදල ගැනිලි ගිණුමට හර කර අවිනිශ්චිත ගිණුමට බැර කළ යුතු වුවද සමහරු එය ප්‍රාග්ධන ගිණුමට හර කර අවිනිශ්චිත ගිණුමට බැර කර තිබෙනු දක්නට ලැබුණි.

(3) රු.55,000/- ක් වූ කුලී ආදායම, කුලී වියදම් ගිණුමට හර කර තිබීම නිවැරදි කිරීම සඳහා අවිනිශ්චිත ගිණුම රු.110,000/- කින් හර කර කුලී වියදම් ගිණුම රු.55,000/- කින් සහ කුලී ආදායම් ගිණුම රු.55,000/- කින් බැර කළ යුතු වුවද සමහරු කුලී වියදම් ගිණුම රු.55,000/- කින් හර කර කුලී ආදායම් ගිණුම රු.55,000/- කින් බැර කර තිබුණි.

(4) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය වූ රු.197,000/- සමහර අයදුම්කරුවන් අවිනිශ්චිත ගිණුමේ බැර පැත්තේ සටහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය (a) සහ (b) වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, (a) කොටසින් නිෂ්පාදන ගිණුම පිළියෙල කිරීම පිළිබඳවද (b) කොටසින් අත් බෑගයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම පිළිබඳවද දැනුම පරීක්ෂාවට ලක්කර ඇත. දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා පහත දැක්වේ:

(1) නිෂ්පාදන ගිණුමේ ආකෘතිය පිළිබඳවත්, වියදම් සටහන් කිරීමේ ක්‍රමවේදය පිළිබඳවත් සමහරුන්ගේ දැනුම ඉතාමත් අඩු මට්ටමක පවතින බව දක්නට ලැබුණි.

(2) නොනිමි භාණ්ඩ ප්‍රාථමික පිරිවැය යටතේ සටහන් කළ යුතු බව ප්‍රශ්න පත්‍රයේ පැහැදිලිව සඳහන් කර තිබුණද, එය සැලකිල්ලට නොගත් සමහරු එය නිෂ්පාදන ගිණුමේ අවසානයට සටහන් කර තිබෙනු දක්නට ලැබුණි.

(3) කර්මාන්තශාලා කළමනාකරුගේ වැටුප කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය යටතේ පෙන්නුම් කළ යුතු වුවද සමහරු එය සෘජු වියදමක් ලෙස සලකා ප්‍රාථමික පිරිවැය යටතේ සඳහන් කර තිබෙනු දක්නට ලැබුණි.

(4) සමහරු නිෂ්පාදන ගිණුම නිවැරදිව පිළියෙල නොකිරීම නිසා මුළු නිෂ්පාදන පිරිවැය ලෙස වැරදි අගයක් ලබා ගැනීමෙන් (b) කොටසට අදාලව විමසා ඇති අත් බෑගයක නිෂ්පාදන පිරිවැය ලෙස වැරදි අගයක් ලබාගෙන ඇති බව දක්නට ලැබුණි.

(5) එක් අත් බෑගයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා මුළු නිෂ්පාදන පිරිවැය නිෂ්පාදිත බෑග් ප්‍රමාණයෙන් බෙදිය යුතු වුවද, එම ක්‍රමවේදය නොදත්කමින් සමහරු (b) කොටසට උත්තර සපයා නොතිබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය ද (a) සහ (b) වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, (a) කොටසින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ (b) කොටසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක් කර ඇත. උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේදී පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා පහත දැක්වේ:

**(a) <u>විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය</u>**

(1) විකුණුම් කොමිස්, වියදමක් වුවද සමහරු එය ආදායමක් ලෙස පෙන්නුම් කර තිබුණි.

(2) විකුණුම් කොමිස් වෙනම අයිතමයක් වශයෙන් පෙන්නුම් කළ යුතු වුවද, සමහරු එය විකුණුම් වලින් අඩුකර පෙන්නුම් කර තිබුණි.

(3) බෙදාහැරීම්, පරිපාලන සහ මූල්‍ය වශයෙන් වියදම් වර්ගීකරණයකින් තොරව සමහරු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදම් සටහන් කර තිබෙනු දක්නට ලැබුණි.

(4) බොල්ණය ලියා හැරීම බොහෝ පිරිසක් අත්හැර තිබූ හෙයින් අඩමාන ණය ප්‍රතිපාදනය වැරදි අගයක් ගෙන තිබුණි.

(5) සමහරු අඩමාන ණය අඩි වෙන්කිරීම ආදායමක් ලෙස පෙන්නුම් කර නොතිබුණි.

(6) ඉඩම් සහ ගොඩනැගිලි ක්ෂය කිරීමේදී ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් සැලකිල්ලට ගත යුතු වුවද සමහරු මුළු වටිනාකම මත ක්ෂය කර තිබෙනු දක්නට ලැබුණි.

(7) රක්ෂණ වියදම ඊළඟ මූල්‍ය වර්ෂයට අදාල වුවද, එය සැලකිල්ලට නොගත් සමහරු එය ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර තිබෙනු දක්නට ලැබුණි.

(b) <u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය</u>

(1) ඊළඟ මූල්‍ය වර්ෂයට අදාල වන රක්ෂණ වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර නොතිබුණි.

(2) බොල්ණය වශයෙන් ලියාහැරිය යුතු රු.150,000/- ක මුදල ලැබියයුතු මුදල් වලින් අඩුකර පෙන්නුම්කළ යුතු වුවද, සමහරු එය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(3) ප්‍රශ්න පත්‍රය තුල ශේෂ පිරික්සුමේ අගයන් රු.'000 වශයෙන්ද, ගැලපිලි සටහන් මුළු අගයන් මතද දක්වා තිබීම අවබෝධ කර නොගත් සමහරු ගැලපිලි සටහන් මුළු අගයන් මත දැක්වීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වැරදි අගයන් පෙන්නුම් කර ඇති බව දක්නට ලැබුණි.

- - -

<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කරගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත සෘජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

4. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීම සහ අවශ්‍ය කුසලතා ගොඩනගා නැගීම.

5. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

6. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

7. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

8. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

9. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -